**බුත්තල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 15 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බුත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ----------------------------- | --------------- | ----------------------- |
| (i) | සමාලෝචිත වර්ෂයට අදාල රු. 171,242 ක් වූ වියදම් ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ජනවාරි මස ගෙවූ වවුචර්පත් මගහැරීම හේතුවෙන් ණයහිමි වෙන් නොකළ අතර ඉදිරියේදී ගිණුම් නිවැරදි කරන බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපූර්ණය කරගත යුතු හිඟ වැටුප්, රු. 29,445 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | වැටුප් ප්‍රතිපූර්ණ ලේඛනයේ වැරදි ලෙස සටහන් වී ඇති අතර ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |
| (iii) | සභාවට අයත් සුසාන භූමි 11 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමෙන් පසුව ගිණුම්ගත කරන බව දන්වමි. |

(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 302,102,257 ක ඉඩම් හා ගොඩනැගිලි සඳහා තක්සේරු වාර්තාද, රු.705,816 ක වටිනාකමැති කර්මාන්ත 2 ක් සම්බන්ධයෙන් අදාල ලිපිගොනුද, රු. 2,082,535ක හිඟ වරිපනම් බදු සහ එකතුව රු. 3,728,695 ක පොදු තැන්පත් ශේෂ 70 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණද විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී ස්ථාවර වත්කම් තක්සේරු කරන බවද, කාල විශ්ලේෂණ ඉදිරිපත් කරන ලෙස විෂයභාර නිලධාරියා වෙත උපදෙස් දුන් බව දන්වමි. |

**1.4** <u>අනුකූල නොවීම් නීති, ති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (i) 19 (xii) වගන්තිය | විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබානොගෙන කඩකාමර 16 ක් 2012 ජනවාරි 01 දින සිට වසර 30 කට බදු දී තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වසර 30 කට බදුදීමට අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත් බවට පැහැදිලි තොරතුරු නොමැති බව සඳහන් කරමි. |
| (ii) 122 හා 126 වගන්ති | සභා බලප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබුණු ප්‍රචාරක දැන්වීම් පුවරු 182 ක් සඳහා ඉකුත් වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු. 819,100 ක් අයකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකරගෙන නොමැත. |
| (iii)139 වගන්තිය | වරිපනම් බදු පැනවීමකට යටත් දේපල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවා නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ දක්වා වාර වාර්තා කැඳවා නොමැති බවද, ඉදිරියේදී කැඳවීමට කටයුතු කරන බව දන්වමි. |
| (iv) 158,162 හා 163 වගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 2,082,535 ක හිඟ වරිපනම් බදු අයකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පවතින වසංගත තත්ත්වය මත වරිපනම් බදු අයකිරීම තාවකාලිකව නවතා ඇති බවද, ඉදිරියේදී අයකරන බවද, සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u><br>මු.රෙ. 571 | එකතුව රු. 70,582 ක් වූ වර්ෂ දෙකකට වැඩි තැන්පත් ශේෂ 02 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | වර්ෂ 02කට වැඩි ශේෂ ආදායකයන් විමසා ආදායමට ගතයුතුවේ. | ලිපිගොනු නොමැති බව දන්වමි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය. | සභාවට අයත් වාහන 18 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුවේ. | ඉදිරියේදී ඉන්ධන දහන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,040,151 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,208,783 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්පත් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,219,792 | 2,230,617 | 1,429,243 | 801,374 | 2,219,792 | 2,231,792 | 1,294,043 | 937,749 |
| (ii) | කුලී | 6,014,600 | 7,143,427 | 5,629,423 | 1,514,004 | 6,041,600 | 6,730,946 | 6,581,511 | 149,435 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,141,000 | 1,700,202 | 1,700,202 | - | 1,141,000 | 1,570,772 | 1,570,772 | - |
| (iv) | වෙනත් ආදායම් | 29,473,500 | 22,056,390 | 11,758,850 | 10,297,540 | 29,473,500 | 22,224,707 | 15,080,568 | 7,144,139 |
| | එකතුව | 38,848,892 | 33,130,636 | 20,517,718 | 12,612,918 | 38,875,892 | 32,758,217 | 24,526,894 | 8,231,323 |

### 2.2.2 වරිපනම් හා බදු

| | | | |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 2,513,581 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 1,337,433 ක් අයකරගෙන නොතිබුණි. එම අය නොකළ මුදල වර්ෂය ආරම්භයේ පැවති හිඟ වරිපනම් මුදලින් සියයට 53 ක් විය. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 1,979,550 ක් වූ වරිපනම් බදු ආදායමින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 762,374 ක් රැස්කර නොතිබුණු අතර, එය මුළු බිල් කළ ආදායමින් සියයට 38 ක් විය. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරමි . |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.10,000ට වැඩි හිඟ වරිපනම් බදු ඒකක 19 කින් අයවිය යුතු හිඟ මුදල රු. 866,799 ක් විය. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඈ) | වරිපනම් බදු අයකිරීමට අදාල දේපල වසර 5 කට වරක් තක්සේරු කළ යුතු වුවද 2007 වර්ෂයේ සිදුකළ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයටද බදු අයකර තිබුණි. | වසර 5 කට වරක් දේපල තක්සේරු කළ යුතුවේ. | නව තක්සේරුව මේ වන විට සිදුකර ඇති අතර 2021 වර්ෂයේ සිට අයකිරීමට කටයුතු කරමි. |
| (ඉ) | වරිපනම් තක්සේරු කර තිබුණු දේපල 539 ක අයිතිකරුවන් හඳුනාගෙන නොතිබුණි. | අයිතිකරුවන් හඳුනාගත යුතුවේ. | දේපලවල නාම සංශෝධන කටයුතු මගින් වරිපනම් ලේඛනයට නම් ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

### 2.2.3 ජල ගාස්තු ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 1කට අධික කාලයක සිට අයනොවී පවතින රු. 441,523 ක් වූ හිඟ ජල ගාස්තු අයකර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුවේ. | රු. 266,223 ක් අයකරගෙන ඇති අතර ඉතිරි මුදල ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ ස්ථාපනය කර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 07කට අදාලව වර්ෂ 1කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු. 114,000 ක ගාස්තු සහ සමාලෝචිත වර්ෂයට අදාල රු. 18,000 ක ගාස්තු අයකර නොතිබුණි. | හිඟ දුරකතන සම්ප්‍රේෂණ කුළුණු ආදායම් අයකරගත යුතුවේ. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරමි. |

**2.2.5** **<u>යන්ත්‍රෝපකරණ කුලී ආදායම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් වාහන/යන්ත්‍ර 09 ක් 2010 වර්ෂයේ සිට 2019 අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුළ කුලියටදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 5,033,718 ක හිඟ කුලී ආදායම් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | අයකර ගැනිමට විවිධ පියවර ගෙන ඇති අතර නොගෙවන අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

**2.2.6** **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු උසාවි දඩ රු. 2,520,642 ක් සහ මුද්දර ගාස්තු රු. 6,694,172 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩවලින් රු. 414,918 ක් හා මුද්දර ගාස්තුවලින් රු. 2,073,133 ක් අයකර ඇති අතර ඉතිරි මුදල ලබා ගැනීමට උපලේඛන යොමුකර ඇත. |

**2.3** **<u>අධිභාර</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව මව්සින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 720,241 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | හිඟ අධිභාර අය කර ගත යුතුවේ. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරමි. |

**3.** **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**3.1** **<u>කාර්ය සාධනය</u>**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඉන් කාරණා 20 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | රථගාල් සඳහා අතුරු ව්‍යවස්ථාව සකස් කොට අනුමැතියට යවා ඇති අතර අනෙක් අතුරු ව්‍යවස්ථා පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ගැසට් පත්‍රයේ පළකළ පසු ඒවා වැළඳ ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ඝනඅපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු 2011 වර්ෂයේදී ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒ සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතුවේ. | මධ්‍යම පරිසර අධිකාරිය වෙත පරීක්ෂණ ගාස්තු ගෙවා ඇති අතර, මේ දක්වා ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නොපැමිණ ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | මෙම විෂයය මේ වන විට නිලධාරියෙකු වෙත භාරදී ඒ පිළිබඳ වගකීම පවරා ඇත. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|

(අ) අනවසර ඉදිකිරීම්

| | | |
|---|---|---|
| බුත්තල සතිපොළ භූමියෙහි අනවසර ඉදිකිරීම් 4 ක් පවතින බව 2018 ඔක්තෝබර් 30 දින හඳුනාගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් | අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතුවේ. | ඉදිකිරීම් දෙකක් මේ වන විට ඉවත් කර ඇති අතර අනෙකුත් ඉදිකිරීම් |

| | | |
|---|---|---|
| ඉන් අනවසර ඉදිකිරීම් 3 ක් සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | ඉවත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට සභාවට ඉදිරිපත් කර ඇත. |

**(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේශීය ණය සහ සංවර්ධන අරමුදලට සහ වෙනත් ආයතන හා පුද්ගලයින් 09 දෙනෙකුට 2016 සිට 2018 දක්වා වර්ෂවලට අදාලව ගෙවිය යුතු රු. 4,750,901 ක් වූ ණය වාරික හා මුදල් ගෙවා නොතිබුණි. | ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ණයහිමියන්ගෙන් රු. 3,648,884 ක් අප්‍රේල් මාසය වන විට ගෙවා ඇත. |

**3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|

**(අ) <u>කාර්ය මණ්ඩල පුරප්පාඩු</u>**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 8 කට අදාලව සේවක පුරප්පාඩු 17 ක් පැවතුණි. | කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතුවේ. | පුරප්පාඩු පිළිබඳව සෑම මසකම පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත. |

**(ආ) <u>සේවක ණය</u>**

| | | |
|---|---|---|
| සේවකයින් 26 දෙනෙකුගෙන් වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු. 123,169 ක ණය අයකර නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගත යුතුවේ. | අයකළ නොහැකි ශේෂ පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන බව දන්වමි. |

**3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|

**(අ) <u>හිඟ දේපල බදු කුලී</u>**

| | | |
|---|---|---|
| 1988 සිට 2012 වර්ෂය දක්වා සභාවට අයත් සතිපොළ, ගවමස් කඩ, එළුමස් කඩ හා කුකුල් මස් කඩ ඇතුළු දේපල 06 ක් බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු. 1,176,445 ක් අයකර නොතිබුණි. | හිඟ දේපළ බදු කුලී අයකරගත යුතුවේ. | ඇතැම් බදු කරුවන් මේ වන විට මිය ගොස් ඇත. |

**(ආ) <u>ඉවත්කළ කඩ කාමරවලින් අයවිය යුතු හිඟ කුලී</u>**

| | | |
|---|---|---|
| සභාවට අයත්ව තිබුණු ඉවත් කරන ලද පැරණි කඩකාමර 14 කින් අයවිය යුතු රු. 181,598 ක් අයකර නොතිබුණි. | හිඟ දේපළ බදු කුලී අයකරගත යුතුවේ. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන කපා හැරීමට සභාව තීරණය කර ඇත. |

**(ඇ) <u>සතිපොළ බදු කුලී</u>**

| | | |
|---|---|---|
| බුත්තල සතිපොළ සමාලෝචිත වර්ෂයට බදුදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු රු.1,193,384 ක හිඟ බදු මුදල හා රු. 1,358,640 ක ප්‍රමාද දඩ මුදල අයකර නොතිබුණි. | හිඟ පොළ බදු කුලී අයකරගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා බදුකරු දැනුවත්කර ඇති අතර නොගෙවන්නේ නම් නඩු පැවරීමට කටයුතු කරමි. |

**(ඈ) <u>කඩ කාමර කුලී</u>**

| | | |
|---|---|---|
| සභාව විසින් දීර්ඝකාලීනව බදු දී තිබුණු කඩ කාමර 67 ක මාසික බදු කුලිය අය කිරීමේදී, ඌව පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව කටයුතු කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභා අරමුදලට රු. 6,987,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරු කුලී අයකරගත යුතුවේ. | ඉදිරියේදී තක්සේරු කුලී අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.5 <u>වත්කම් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) <u>ඉඩම්වල අයිතිය පවරා නොගැනීම</u>** | | |
| සභාවට අයත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් 30 ක මැනුම් කටයුතු සිදුකර නොතිබුණු අතර ඉඩම් 52 ක නීත්‍යානුකුල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම්වල නීත්‍යානුකුල අයිතිය පවරා ගත යුතුවේ. | ඉදිරියේදී මැනුම් කටයුතු සිදුකර පවරා ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) <u>ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදු නොකිරීම</u>** | | |
| සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | ඉදිරියේදී සමීක්ෂණයක් සිදු කරමි. |
| **(ඇ) <u>භාර නොදුන් පුස්තකාල පොත්</u>** | | |
| සභාවට අයත් පුස්තකාල 03 කින් පාඨකයින්ට ලබා දී තිබුණු රු. 196,551 ක පිරිවැය වූ පුස්තකාල පොත් 1051 ක් නැවත ලබාගෙන හෝ ඒ වෙනුවෙන් මුදල් අයකරගෙන හෝ නොතිබුණි. | බැහැර දුන් පොත් නැවත ලබාගත යුතුවේ. | පොත් නැවත ලබා ගැනීමට පුස්තකාලයාධිපතිවරුන් දැනුවත්කර ඇත. |

**(ඇ)** වාහන උපයෝජනය

ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල නොකිරීම

| | | |
|---|---|---|
| සභාවට අයත් වාහන සහ යන්ත්‍රෝපකරණ 05 ක් 2019 ජනවාරි 01 සිට 2019 අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුලදී මීටර් පැය 559.7 ක් ධාවනය කර, කර්මාන්ත 68 ක් ඉටුකළ බව දෛනික ධාවන සටහන්වල දක්වා ඒ සඳහා රු. 520,604 ක ඉන්ධන වියදමක් දරා තිබුණද එම කර්මාන්තවලට අදාලව ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල කළ යුතුවේ. | ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා ඉදිරියේදී පිළියෙල කරන බව දන්වමි. |

**(ඉ)** මාර්ග ඉන්වෙන්ට්‍රිය පිළියෙල කිරීම හා ගැසට් පත්‍රයේ පළකිරීම

| | | |
|---|---|---|
| සභාවට අයත් මාර්ග මැන පිඹුරුපත් සැකසීමට 2017 වර්ෂයේදී රු. 494,396 ක් ගෙවා තිබුණද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාර එම මාර්ග හා මංමාවත්වලට අදාල දැන්වීම් ගැසට් පත්‍රයෙහි පළ කිරීමට කටයුතු කර නොතිබුණි. | මාර්ග හා මංමාවත්වලට අදාල දැන්වීම් ගැසට් පත්‍රයෙහි පළ කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීම හා මාර්ග මැනුම්කර ගැසට් පත්‍රයේ පලකිරීමට කටයුතු කරමි. |

**4.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**4.1** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරියේදී අභ්‍යන්තර විගණනයක් සිදුකරන බව දන්වමි. |

**4.2** විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සභාව තුල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | පළාත්පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදී, එක් එක් පළාත් පාලන ආයතන ආවරණය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පවත්වා ඇති අතර 2020 වර්ෂයේ සිට කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |